ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 ජනවාරි/ පෙබරවාරි
ආර්ථික විද්‍යාව

# ECON 3241.03 - මූල්‍ය ආර්ථික විද්‍යාව

කාලය : පැය තුන (03) යි

දී ඇති උපදෙස්වලට අනුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80ක් හා අඛණ්ඩ ඇගයීම් සඳහා ලකුණු 20ක් ද වශයෙන් ලකුණු වෙන් කර ඇත.

## A – කොටස

මෙම කොටසින් ඕනෑම ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සපයන්න.

01. i. මුදල් යනු කුමක් ද? අපි මුදල් භාවිතා කරන්නේ ඇයි? විවිධ මුදල් වර්ග පිළිබඳ හඳුන්වන්න.

ii. මුදලේ කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 8 බැගිනි)

02. මුදල් ඉල්ලුම පිළිබඳ සම්භාව්‍ය හා කේන්සියානු ප්‍රවේශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 16 යි)

03. ෆිෂර්ගේ ගනුදෙනු ප්‍රවේශය සහ කේම්බ්‍රිජ් මුදල් ශේෂ න්‍යාය අතර සබඳතාව සාකච්ඡා කරන්න.

(ලකුණු 16 යි)

04. "ෆ්‍රීඩ්මාන්ගේ මුදල් ප්‍රමාණවාදී විග්‍රහය ෆිෂර්ගේ සමීකරණය මත පදනම් වේ." සාකච්ඡා කරන්න.

(ලකුණු 16 යි)

B – කොටස

ඕනෑම ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සපයන්න.

05. i. මූල්‍ය සැකැස්ම කෙරෙහි අහිතකර වරණය බලපාන ආකාරය පැහැදිලි කරන්න. මූල්‍ය පද්ධතිය තුළ අහිතකර වරණය පිළිබඳ ගැටළුව විසඳීම සඳහා භාවිතා වන ක්‍රමවේද දක්වන්න.

ii. "බැංකු යනු ආර්ථිකයේ කුටුම්භ සහ ව්‍යාපාර අංශ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සලසා දෙන ප්‍රධාන මූල්‍ය අතරමැදිකරණ ආයතනය යි." ණය හිමියන් සහ ණය ගැතියන් ලෙස මූල්‍ය අතරමැදිකරණයේ පවතින වාසි සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 8 බැගිනි)

06. i. "මුදල් වෙළඳපොළ මගින් ආයතනික ආයෝජකයන් සහ මහා පරිමාණ සමාගම් සඳහා කෙටිකාලීන අරමුදල් සැපයීම සිදු කරයි." කෙටිකාලීන මුදල් වෙළෙඳපොළෙහි ලක්ෂණ, උපකරණ සහ ගනුදෙනු සිදු වන ආකාරය පිළිබඳ පැහැදිලි කරන්න.

ii. පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ බැඳුම්කර වෙළෙඳපොළේ මෑතකාලීන ප්‍රවණතා සහ රජය විසින් බැඳුම්කර වෙළෙඳපොළේ සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ ව පැහැදිලි කරන්න.

(ලකුණු 8 බැගිනි)

07. i. ඒකකභාරයක ලක්ෂණ, ක්‍රියාත්මක වන ආකාරය සහ එහි ඇති අවදානම් පිළිබඳ විස්තර කරන්න.

ii. සමාගම් සඳහා කොටස් වෙළෙඳපොළේ කාර්යභාරය සහ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 8 බැගිනි)

C – කොටස

මෙම කොටසින් ඕනෑම ප්‍රශ්නයකට (01) පිළිතුරු සපයන්න.

08. මුදල් සැපයුමේ සංරචක පැහැදිලි කරන්න. ශ්‍රී ලංකාවේ මුදල් සැපයුමේ මෑතකාලීන ප්‍රවණතා මොනවාද?

(ලකුණු 16 යි)

09. ආර්ථික සංවර්ධනය සඳහා මූල්‍ය පද්ධතියේ වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු 16 යි)

10. මූල්‍ය පද්ධතියේ පොළී අනුපාතික තීරණය වීම පිළිබඳ විවිධ න්‍යායන් විස්තර කරන්න.

(ලකුණු 16 යි)